**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2021**

--------------------------------------------------------------------------------

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සහ 2016 නොවැම්බර් 02 දින එළඹි අංක 3431 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසුණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම් අංක 2790 එස්ආර්අයි (එස්එෆ්) ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940කට සමාන එජඩො මිලියන 68.80 ක් වූ අතර ඉන් රු.මිලියන 7,670කට සමාන එජඩො මිලියන 59ක් මූල්‍යායනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 1,339.33කට සමාන එජඩො මිලියන 9.8ක් ශ්‍රී ලංකා රජය දායක වීමට එකඟ වී තිබුණි. පසු ණය ගිවිසුම් අංක 3431 එස්ආර්අයි (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්යසාධනය පුළුල් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 8,700කට සමාන එජඩො මිලියන 60ක අතිරේක ණය මුදලක් ලබාගෙන තිබුණි. ශ්‍රී ලංකා රජයේ රු.මිලියන 1,071.47කට සමාන එජඩො මිලියන 7.8ක දායකය සමග ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,771.47කට සමාන එජඩො මිලියන 67.8ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

------

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**2.1** **නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 19 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/චක්‍රලේඛ/06/2 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය සහ 2020 සැප්තැම්බර් 03 දිනැති අංක 05/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.ඇ වගන්තිය | ව්‍යාපෘති කළමනාකරණය සඳහා උපදේශන සමාගම සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමේ කාලය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමකින් තොරව මාස 24කින් දීර්ඝ කර තිබුණි. | නොවැළැක්විය හේතූන් නිසා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමට සිදුවී ඇත. ව්‍යාපෘතියේ අවශ්‍යතා අනුව අදාළ සියලුම අනුමැතීන් ලබාගැනීමෙන් පසු 2019.12.31 දින සිට උපදේශන සේවාවත් මාස 24කින් දීර්ඝ කරන ලදි. | ව්‍යාපෘති උපදේශන සේවාව කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය වේ. |

**3** **භෞතික කාර්යසාධනය**

---------------------------

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

-------------------------------------------------

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක ඔවුන්ගේ යටිතල පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, 2017 වර්ෂය අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යාපෘති 29 ක්, ඉදිකිරීම් කටයුතු 35 සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර ඉන් පෙර වර්ෂය අවසානය වන විට ජල සම්පාදන ව්‍යාපෘති 11ක් හා යටිතල පහසුකම් ව්‍යාපෘති 23ක් සම්පූර්ණ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ජල සම්පාදන ව්‍යාපෘති 08ක් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති 02ක කටයුතු සම්පූර්ණ කර තිබුණි. එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සම්බන්ධ ගැටලු පහත දැක්වේ.

### 3.1.1 උප ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන්

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ක්‍රියාකරකම | නිම කිරීමට සැලසුම් කළ දිනය | ප්‍රමාදය (මාස) | ප්‍රමාදයටහේතුව |
|---|---|---|---|---|
| (අ) | මින්නේරිය ජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීමේ ඉතිරි කටයුතු- මින්නේරිය ප්‍රාදේශීය සභාව | 2020 මාර්තු 24 | 08 | 01. අමුද්‍රව්‍ය ආනයනයේදී කරන ලද සීමාකිරීම්නිසා<br>02. ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය අරමුදල් වලින් ගෙවීම් ප්‍රමාදය<br>ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ අනුමැතිය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය මගින් අමුද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය |
| (ආ) | සේවාගම ඇල මාර්ග 03 ප්‍රදේශය වෙත නළ මාර්ග පුළුල් කිරීම සහ සේවාගම ජල කුළුණ දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග පුළුල් කිරීම - තමන්කඩුව ප්‍රාදේශීය සභාව | 2020 පෙබරවාරි 24 | 19 | 01. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නළ මාර්ග වෙනස් කිරීම හේතුවෙන් නළ එලීමේ ප්‍රමාදය විය.<br>02. පුපුරණ ද්‍රව්‍යවල හිඟකම සහ පිපිරීම් කටයුතු සඳහා අවසරය ලබා ගැනීමට අපහසු වීම.<br>03. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කටයුතු තාවකාලිකව අත්හිටුවීම.<br>04. ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය අරමුදල් නොමැතිවීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම.<br>05. සේවාගම නගරයේ සැලැස්ම වෙනස්වීම හේතුවෙන්. |
| (ඇ) | තඹලල ජල සම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම | 2020 පෙබරවාරි 06 | 13 | 01. පුපුරණ ද්‍රව්‍යවල හිඟකම සහ පිපිරීම් කටයුතු සඳහා අවසරය ලබා ගැනීමට අපහසු වීම.<br>02. ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය අරමුදල් නොමැතිවීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම.<br>03. සැලැස්මේ වෙනස්කම් හේතුවෙන් අමතර කටයුතු සිදුකිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | නුවරවැව ජල පවිත්‍රාගාරයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම | 2020 මාර්තු 24 | 17 | -එම- |
| (ඉ) | කලා වැව ජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම | 2020 සැප්තැම්බර් 15 | 15 | අනෙකුත් කරුණුවලට අමතරව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ප්‍රමාදවී ඇත. |
| (ඊ) | කැබිතිගොල්ලෑව ජලසම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම. | 2020 ජුනි 22 | 08 | 1. කටයුතු සාමාන්‍ය පිපිරීම්වල සිට පාලිත පිපිරීම්වලට වෙනස්වී ඇත.<br>2. පුපුරණ ද්‍රව්‍යවල හිගකම සහ පිපිරීම් කටයුතු සඳහා අවසරය ලබා ගැනීමට අපහසු වීම.<br>3. ගෙවීම් ප්‍රමාදයන් |
| (උ) | නිකවැරටිය - අඹන්පොළ ජලසම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම | 2019 දෙසැම්බර් 31 | 24 | කොවිඩ් 19 වසංගතය දැඩිලෙස බලපාන ලදි. |
| (ඌ) | පනන්ගොඩ සහ කුරුපවන්න පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය | 2020 අප්‍රේල් 29 | 17 | අනෙකුත් කරුණුවලට අමතරව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ප්‍රමාදයක් සිදුවිය. |
| (එ) | ඉනාමළුව සහ කිතුල්හිටියාව ජලසම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම | 2020 මැයි 04 | 12 | මුල් විෂය පථයට බාහිරව අමතර නල එළීමක් අනුමත කර තිබුණු අතර එම නිසා කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීමක් ලබාදී ඇත.<br>2019 වර්ෂයේ අගභාගයේ සහ 2020 වර්ෂය තුළදී ප්‍රමාණවත් විදේශ අධාර ප්‍රතිපාදන සහ දේශීය අරමුදල් අග්‍රිම නොලැබීම. |
| (ඒ) | සීගිරිය සහ හබරන ජලසම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම | 2020 අප්‍රේල් 02 | 20 | NSC මගින් අනුමත කළ පරිදි කාලය දීර්ඝ කිරීමක් සමඟ අමතර කටයුත්තක් ලබාදීම. |
| (ඔ) | පොල්ගොල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය, පුස්තකාලය සහ සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 2019 නොවැම්බර් 13 | 17 | ඉඩම් ගැටලුවක් හේතුවෙන් මෙය නැවත සැලසුම් කරන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | කදිරන ශ්‍රවණාගාරයක් ඉදිකිරීම | 2019 ජුනි 26 | 29 | ලීබඩු හැර කටයුතු නිමකර ඇත. ලීබඩු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී. |
| (ඖ) | මහබාගේ වෙළඳපොල සමඟ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 2019 පෙබරවාරි 08 | 31 | වැලිසර නාවික හමුදා කඳවුර අසල පිහිටීම හේතුවෙන් කොවිඩ් -19 මගින් දැඩි ලෙස බලපාන ලදි. |
| (ක) | කැකුනදුර උප නගරය වැඩිදියුණු කිරීම | 2020 මාර්තු 07 | 18 | ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටස විතැන් කිරීම හේතුවෙන් ප්‍රමාදයක් සිදුවී ඇත. |
| (ග) | වරකාපිටිය සුසාන භූමිය හා අවමගල්‍ය ශාලාවක් ඉදිකිරීම | 2020 ජනවාරි 21 | 11 | බිම් සකස් කිරීමේ ප්‍රමාදය |
| (ච) | හෝමාගම නගරයේ වැසිකිළි පද්ධතිය සමඟ පොදු වෙළඳපොල සහ රථගාල ඉදිකිරීම | 2019 නොවැම්බර් 13 | 10 | ප්‍රාදේශීය සභාව විසින් වැසිකිළි කඩා ඉවත් කිරීමේ ප්‍රමාදය |
| (ජ) | වාද්දුව පොදු වෙළඳපොල ඉදිකිරීම | 2020 මාර්තු 22 | 21 | සැලැස්ම වෙනස්වීම හේතුවෙන් ප්‍රමාදයක් සිදුවී ඇත. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනයත් පවතින බව සත්‍යක් වේ. කෙසේවෙතත්, කාර්යසාධනයේ අඩුපාඩු සඳහා ප්‍රධාන හේතු පහත දැක්වේ.

- කොවිඩ් 19 වල ඍජු සහ වක්‍ර බලපෑම
- රජය විසින් පනවන ලද ආනයන සීමාකිරීම
- කොන්ත්‍රාත් ගෙවීම් සඳහා ප්‍රතිපාදන/අග්‍රිම නොමැතිවීම හේතුවෙන් 2020 වර්ෂයේදී සියලුම කොන්ත්‍රාත් බලපෑමට ලක්විය.

**විගණකගේ නිර්දේශ**

ව්‍යාපෘතිය අවශ්‍ය තත්ත්ව සහතිකවෙමින් කඩිනමින් සිවිල් කටයුතු නිමකිරීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීම අවශ්‍ය වේ.

### 3.1.2 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ක්‍රියාකාරකම් | වෙන් කිරීම | ආරම්භ කළ දිනය | ප්‍රමාදය මාස | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | | | |
| (අ) | කලාවැව පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම | 387 | 2019 මාර්තු 15 | 24 | අදහස් දක්වා නොමැත. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍ය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | කැබිතිගොල්ලෑව ජලසම්පාදන යෝජනා ක්‍රමය | 35 | 2019 සැප්තැම්බර් 19 | 28 | ව්‍යාපෘති නිමකර භාරදී ඇත. | -එම- |
| (ආ) | දඹුල්ල ග්‍රාමීය ප්‍රදේශ සහ කණ්ඩලම සඳහා ජල සම්පාදනය ක්‍රමය පුළුල් කිරීම | 564 | 2019 පෙබරවාරි 28 | 22 | වලංගු හේතූන් සඳහා පමණක් කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත. එම කාලයෙන් පසු ප්‍රමාද හානි පනයනු ලැබේ. | -එම- |
| (ඇ) | ඉනාමළුව සහ කිතුල්හිටියාව දක්වා ජල සැපයුම පුළුල් කිරීම ඉදිකිරීම | 491.99 | 2019 ජනවාරි 02 | 21 | -එම- | -එම- |
| (ඈ) | සීගිරිය සහ හබරණ ප්‍රදේශ දක්වා ජල සැපයුම පුළුල් කිරීම ඉදිකිරීම | 415 | 2019 ජනවාරි 02 | 21 | -එම- | -එම- |
| (ඉ) | බතලයාය සහ බෙලගන්වැව බෙදාහැරීම් ජාල සැපයීම් සහ එලීම | 284 | 2019 ජනවාරි 17 | 21 | -එම- | -එම- |
| (ඊ) | බතලයාය සහ බෙලගන්වැව පිරිපහදුව ඉදිකිරීම | 506.7 | 2019 ජනවාරි 17 | 21 | ලංසු ඇගයීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් | -එම- |
| (උ) | මදුරන්කුළිය බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම | 30 | 2019 ජනවාරි 27 | 21 | නිමකර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇත. | -එම- |
| (ඌ) | මහවිල කුරුසවත්ත පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය | 33 | 2019 මාර්තු 01 | 23 | වලංගු හේතූන් සඳහා පමණක් කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත. | -එම- |
| (එ) | කැකුනදූර උප නගරය වැඩිදියුණු කිරීම | 85.24 | 2019 මාර්තු 08 | 23 | නිමකර ඇත. | -එම- |
| (ඒ) | වරකාපිටිය ආදාහනාගාරය ඉදිකිරීම | 50 | 2019 මාර්තු 01 | 23 | මේ වනවිට නිමකර ඇත. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඔ) | වාද්දූව පොදු වෙළඳපොල ඉදිකිරීම | 63.42 | 2019 මාර්තු 11 | 23 | වලංගු හේතූන් සඳහා පමණක් කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත. | -එම- |
| (ක) | කරුවලගස්වැව ජලසම්පාදන යෝජනා ක්‍රමය | 324.77 | 2021 ජනවාරි 06 | 33 | වලංගු හේතූන් සඳහා පමණක් කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත.සීමා කිරීම් සහ ඩොලරය ඉහල යාම හේතුවෙන් ආනයන ප්‍රමාදවී ඇත. | -එම- |
| (ග) | පහළ දීගල්ල ග්‍රාම සේවා වසම දක්වා ජල සැපයුම දීර්ඝ කිරීම | 124.89 | 2020 නොවැම්බර් 16 | 43 | වලංගු හේතූන් සඳහා පමණක් කාලය දීර්ඝකිරීම් ලබා දී ඇත. ප්‍රාදේශීය වශයෙන් අගුළු දැමීම බරපතල ලෙස බලපා ඇත. | -එම- |

**3.1.3 වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිවල කටයුතු**

2017 අප්‍රේල් මසට පෙර පහත සඳහන් උප ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2022 ජුනි 30 දක්වා එම උප ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට නියමිත දිනය | ඇස්තමේන්තුගත වටිනාකම<br>රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | තණමල්විල සහ හම්බේගමුව බෙදාහැරීම් පද්ධතිය සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමය | 2017 අප්‍රේල් | 1,270 | ජල මූලාශවල ප්‍රමාණවත් ධාරිතාවක් නොමැති වීම සහ අරමුදල් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ සැලැස්ම සංශෝධනය කළ යුතුය. |
| (ආ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා ජල පිරිපහදුව ඉදිකිරීම. | -එම- | 430 | -එම- | -එම- |
| (ඇ) | මධ්‍යම පළාතේ ගැඹුරු නල ළිං පොම්පාගාර 3 ක් ඉදිකිරීම සහ ක්ලෝරීන් මිශ්‍රකරණය | -එම- | 60 | ජල මූලාශ්‍රවල ඵලදායීතාව පරීක්ෂා කිරීම අසමත් වී ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මණ්ඩලය ව්‍යාපෘතිය නතර කිරීමට උපදෙස් ලබාදී ඇත. | |
| (ඈ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා රදවා ගැනීමේ ටැංකි ඉදිකිරීම | -එම- | 100 | ජල මූලාශවල සහ අරමුදල් හා කාලය නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | -එම- |
| (ඉ) | කොටගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | -එම- | 50 | ජාතික මෙහෙයුම් කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටලු නිසා ඉවත් කර ඇත. | -එම- |
| (ඊ) | ආගරපනත ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | -එම- | 50 | ජාතික මෙහෙයුම් කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටලු නිසා ඉවත් කර ඇත. | -එම- |

**3.2 නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**I පෙරටු කාර්යාල පද්ධතිය සහ ඉ-පුරනැගුම මෘදුකාංගය**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය විසින් ප්‍රාදේශීය සභා 137ක් සඳහා දෘඩාංග සමග ඉදිරිපස කාර්යාල පද්ධතිය ලෙස හඳුන්වන තාක්ෂණික විසඳුමක් ක්‍රියාත්මක කර තිබුණි. අලුතින් හඳුන්වා දෙනු ලැබූ පෙරටු කාර්යාල පද්ධතියට (Front Office System) සහය ලබාදීමට පසුපෙළ කාර්යාල පද්ධතියක් (Back Office System) නොමැතිවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු අත්පත් කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මධ්‍යම පළාතේ සහ උතුරු මැද පළාතේ පවතින පළාත් පාලන ආයතන 41 කින් ප්‍රාදේශීය සභා 17ක් ඉහත පද්ධතිය සම්පූර්ණයෙන් භාවිතා කර නොතිබූණු අතර ප්‍රාදේශීය සභා 16ක් ඉහත පද්ධතිය ක්‍රියාත්මක නොකර විකල්ප නව මෘදුකාංග මිලදී ගෙන තිබුණි. | සමහර ප්‍රාදේශිය සභා වරිපනම් බදු අය නොකරන අතර එවැනි ප්‍රාදේශිය සභා මෙම පද්ධතිය ක්‍රියාත්මක වී නොතිබුණි. | මෘදුකාංගයේ පවතින අඩුපාඩු නිවැරදි කළ යුතු අතර අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් සහ මෘදුකාංග භාවිත කළ යුතුය. |

**II සිවිල් සහ ජලසම්පාදන ව්‍යාපෘති**

| | නිශ්කාර්ය වත්කම් | නිශ්කාර්ය කාලය (අවුරුදු) | දරන ලද පිරිවැය (රු. මිලියන) | හේතු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | පොල්පිතිගම ජල සම්පාදන පද්ධතිය | 03 1/2 | 58.32 | අනවශ්‍ය ඉදිකිරීම් | පොල්පිතිගම ප්‍රාදේශීය සභාව වෙත බවුසර ලබා දී ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | නිශ්කාර්යය වියදම් අවම කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | මීගහකියුල බස්නැවතුම | 3 2/3 | 48.05 | ප්‍රවේශ මාර්ග නොමැතිවීම හේතුවෙන් | (අ) කෙටිදුර සඳහා ධාවනය වන තනිදොර සහිත බස්රථ සඳහා බස්නැවතුම් පොළ 2021.04.17 දින ආරම්භ කර තිබේ.<br><br>(ආ) මහියංගනය බදුල්ල මාර්ගය සමග සම්බන්ධ කිරීමට අවශ්‍ය මාර්ග කොටස් සඳහා ඉඩම් අත්පත්කර ගැනීමට ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතී. | බස්නැවතුම් පොළ භාවිතයට ගැනීමට ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවට සහය දීමට පියවර ගත යුතුය. |
| (ඇ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සතිපොළ, බහුකාර්ය ගොඩනැගිල්ල, වැසිකිලි, ජල සම්පාදන පද්ධතිය | 4 2/12 | 35.86 | ප්‍රවේශ මාර්ග නොමැතිවීම, වැසිකිලි නඩත්තුව සඳහා ජල මූලාශ සහ ජල සැපයුම නොමැති වීම | ඉඩකඩ ගැටළු හේතුවෙන් සතිපොළ මෙවන තෙක් ක්‍රියාත්මක නොවේ. දුම්රිය දෙපාර්තමේන්තුව ඉඩමක් ලබා දීමට එකගවී ඇති අතර ප්‍රාදේශීය සභාව අමතර ඉඩ සමග එය හැකි ඉක්මනින් විවෘත කිරීමට එකගවී ඇත. | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් සංවර්ධන වැඩ භාවිතයට අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | රත්තොට ප්‍රාදේශීය සභාවේ සතිපොළ | 5 ¾ | 12.06 | එය අපේක්ෂිත සැලැස්ම සමග අනුකුල නොවීම නිසා ගොඩනැගිල්ල කුටිවලට පරිවර්තනය කිරීමට ප්‍රාදේශීය සභාව පියවර ගෙන තිබුණි. | ප්‍රාදේශීය සභාව විසින් වෙළෙන්දන් වෙත කඩසාප්පු 10ක් ටෙන්ඩර් කර ඇති අතර ගොඩනැගිල්ලේ ඉහළ මහල පුස්තකාලයක් ලෙස භාවිතා කර ඇත. කෙසේවෙතත්, කොවිඩ් 19 හේතුවෙන් සියළුම කඩ සහ පුස්තකාලය ක්‍රියාත්මක නොවුණි. | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිල්ල යොදාගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | කිරම බස්නැවතුම් පොළ | 4 2/3 | 36.29 | ප්‍රවේශ මාර්ග නොමැතිවීම | බස්නැවතුම්පොළ බිම් මහළ ක්‍රියාත්මක වේ. අපේක්ෂිත අරමුණු සඳහා ඉහළ මහළ භාවිතයට ගැනීමට ප්‍රාදේශීය සභාව එකගවී ඇත. | බස් නැවතුම්පොළ භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. |
| (ඊ) | විල්ගමුව ආදාහනාගාරය | 4 1/4 | 16.52 | ආදාහනාගාරය සඳහා ඉල්ලුම නොමැතිවීම. | ක්‍රියාත්මක වේ. | විල්ගමුව ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීමේ අවශ්‍යතාව නිසිපරිදි ඇගයීමක් කළ යුතු අතර ව්‍යාපෘතිය විසින් ලබාදෙන මුදල් නාස්තියකින් තොරව උපයොජනය කළ යුතුය. |
| (උ) | වනාතවිල්ලුව ජල සම්පාදන පද්ධතිය | 3 ½ | 64.83 | අපේක්ෂා කළ පරිදි ප්‍රාදේශීය සභාව විසින් ජලසම්පාදන | ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ | ප්‍රතිලාභීන් වෙත පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘතියේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | පහසුකම් ලබාදී නොතිබුණි. | සම්බන්ධතාව ලබාගෙන ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම අවශ්‍ය වේ. |
| (ඌ) | රිදීගම බහුකාර්ය ගොඩනැගිල්ල සහ බස්නැවතුම් පොළ | 3 ¾ | 44.05 | ඉදිකිරීමේ කොටසක් නිමකර නොමැත. | ගොඩනැගිල්ල සහ බස්නැවතුම් පොළ විවෘත කර ඇති අතර කටයුතු සිදු කරමින් පවතී. | -එම- |
| (එ) | මාවතගම බස්නැවතුම් පොළ | 04 | 43.79 | ඉදිකිරීමේ කොටසක් නිමකර නොමැත. | බස්නැවතුම්පොළ ක්‍රියාත්මක වේ. ප්‍රදේශිය සභාව විසින් ඉහළ මහලේ ඉදිකිරීම් කටයුතුත් ආරම්භ කර සිදුකරමින් පවතී. | ඉදිකළ ගොඩනැගිලි උපයෝජනයට පියවර ගත යුතුය. |
| (ඒ) | විල්ගමුව ජලසම්පාදන යෝජනා ක්‍රමය | 4 | 39.98 | නිසි සැලැස්මක් නොතිබුණු අතර ජල ටැංකි ඉදිකිරීමේදී බිම් මට්ටම සලකා නොතිබුණි. | උප ව්‍යාපෘතිය එකතු කිරීමට සපයන අතිරේක මූල්‍යනය යටතේ AW1 කොන්ත්‍රාත්තුව මගින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. | විශේෂඥ උපදෙස් ලබාගෙන වැරදි නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඔ) | දික්ලන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමය | 4 1/6 | 28.62 | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම නිශ්කාර්යව පවති. | ව්‍යාපෘතිය හඳුනාගන්නා ලද අඩුපාඩු නිවැරදි කර ඇත. මේවන විට ක්‍රියාත්මක වේ. | වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කිරීමට පියවර ගත යුතුය. |
| (ඕ) | ඉපලෝගම සනීපාරක්ෂක මධ්‍යස්ථානය | 4 5/6 | 2.81 | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම නිශ්කාර්යව පවති. | උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඖ) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බණ්ඩිවැව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ තම්බලවැව දක්වා ජල සම්පාදන දිගුව | 3 5/12 | 77.60 | මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා මින්නේරිය ජල පවිත්‍රාගාරයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවේ. | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් මින්නේරිය ජල පවිත්‍රාගාරය සංවර්ධනය කරමින් පවතී. | -එම- |
| (ක) | සේවාගම ඇල මාර්ග 03 ප්‍රදේශය වෙත නළ මාර්ග පුළුල් කිරීම සහ සේවාගම ජල කුළුණ දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග පුළුල් කිරීම. | 1 7/12 | 428.35 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් අනුව ගෘහස්ථ සම්බන්ධතාවය ලබාදීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ වගකීම වේ. | -එම- |
| (ග) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තම්බල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දීර්ඝ කිරීම | 1 1/12 | 269.72 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | සැපයුම් ජල සම්බන්ධතාව ලබා දීමට පියවර ගත යුතුය. |
| (ච) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහඉලුප්පම සහ තිරප්පනේ දක්වා ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දීර්ඝ කිරීම | 2 5/12 | 168.66 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |
| (ජ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉලගමුව ප්‍රධාන පොම්පාගාරය සහ බෙදාහැරීම් පද්ධතිය දක්වා ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දීර්ඝ කිරීම | 1 1/3 | 406.37 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ට) | කැබිතිගොල්ලෑව ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම- උතුරු මැද පළාත | 2/3 | 32.23 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |
| (ඳ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය, නාමල්ගමුව සහ කන්දේගම පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමය වැදියුණු කිරීම | 1 ¾ | 27.14 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |
| (න) | නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සඳහා පනන්ගොඩ සහ කුරුසවත්ත ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදිකිරීම | 1 5/12 | 44.77 | ප්‍රජා මූල සංවිධානය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ගෘහස්ථ සම්බන්ධතාවය ලබාදීම ප්‍රාදේශිය සභාවේ වගකීම වේ. | සැපයුම් ජල සම්බන්ධතාව ලබා දීමට පියවර ගත යුතුය. |
| (ප) | රිදීමාලියද්ද සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමය (කුරලවැල, එකිරියන්කුඹුර) | 2 5/6 | 137.92 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් අනුව ගෘහස්ථ සම්බන්ධතාවය ලබාදීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ වගකීම වේ. | -එම- |
| (බ) | රහතන්ගම, කුමාරගම සහ කුකුරම්පොළ සඳහා ජලසම්පාදන දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය (බුත්තල ජල සම්පාදන යොජනා ක්‍රමයේ සිට) | 1 1/12 | 285.94 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ම) | ඉනාමළුව සහ කිතුල්හිටියාව දක්වා ජල සැපයුම දීර්ඝ කිරීම ඉදිකිරීම | 1 | 491.99 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |
| (ය) | සීගිරිය සහ හබරණ ප්‍රදේශ දක්වා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම. | 1 2/3 | 415.30 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි ජල සැපයුම් පහසුකම් ලබා දී නොතිබුණි. | -එම- | -එම- |
| (ර) | නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සඳහා දුන්කන්නාවේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 5/12 | 26.66 | කොවිඩ් 19 වසන්ගතයේ සෘජු සහ වක්‍ර බලපෑම් ඇතිවිය. | ගොඩනැගිල්ලේ කටයුතු සිදුකෙරේ. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් යොදාගැනීමට පියවර ගත යුතුය. |
| (ල) | පුත්තලම ප්‍රාදේශීය සභාව සඳහා මදුරංකුලියේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 5/6 | 34.70 | කොවිඩ් 19 වසන්ගතයේ සෘජු සහ වක්‍ර බලපෑම් ඇතිවිය. | ගොඩනැගිල්ලේ කටයුතු සිදුකෙරේ. | -එම- |
| (ව) | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව සඳහා පොල්ගහවෙල නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම | 2 1/6 | 60.55 | නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල භාවිතයට නිසි සැලසුමක් නොමැතිවීම. | පළාත් සභාව විසින් ඉදිකිරීමේ දෙවැනි අදියර සිදු කරමින් පවතී. ඉදිකිරීම් අවසන්වූ වහාම එය ක්‍රියාත්මක කළ හැකිවේ. | -එම- |
| (ශ) | කටාන ප්‍රාදේශීය සභාව සඳහා කදිරන ශ්‍රවනාගාරය/ප්‍රජාශාලාව ඉදිකිරීම | 1 1/2 | 74.84 | ශ්‍රවනාගාරය/ප්‍රජා ශාලාව භාවිතයට නිසි සැලසුමක් නොමැතිවීම. | -එම- | -එම- |
| (ස) | තංගල්ල ප්‍රාදේශීය සභාව සඳහා නෙටොල්පිටියේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සහ | 3 | 56.46 | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැති අතර එහි | මෙම උප ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව විසින් තෝරාගෙන | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සතිපොළ ඉදිකිරීම. | | | ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම නිශ්කාර්යව පවති. | පළාත් සභාව විසින් නිර්දේශ කර අමාත්‍යාංශ කමිටුව විසින් අනුමත කර ඇත. මෙම සතිපොළහි කටයුතු ආරම්භක අදියරේ ක්‍රියාත්මක වේ. නමුත් කොවිඩ් වසංගතය නිසා අකර්මන්‍ය වී ඇත.ටෙන්ඩර් කැඳවා ඇතත් ප්‍රතිචාරයක් නොමැති බව පළාත් පාලන ලේකම් විසින් දන්වා ඇත. | |
| (හ) | කුරුණෑගල ප්‍රාදේශීය සභාව සඳහා කුරුණෑගල නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 1/4 | 55.74 | යෝග්‍යතා මධ්‍යස්ථානය හා අවන්හල භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | යෝග්‍යතා මධ්‍යස්ථානය හා අවන්හල ක්‍රියාත්මක නොවේ. අනෙකුත් කටයුතු සිදුවෙමින් පවතී. | -එම- |
| (ළ) | මහර ප්‍රාදේශීය සභාව- අදියර 1 සඳහා පහළ කරගහමුන දිවා සුරැකුම් මධ්‍යස්ථානය, ආයුර්වේද මධස්ථානය, මහජන පුස්තකාලය සහ ප්‍රාදේශීය සභා කාර්යාලය ඇතුළුව බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 2 1/3 | 68.74 | පුස්තකාලය භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | ආයුර්වේද මධස්ථානය සහ මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර වහාම ක්‍රියාත්මක කරනු ලබන බව පළාත් පාලන ආයතනය ප්‍රකාශ කර ඇත. | -එම- |
| (ඥ) | කළුතර ප්‍රාදේශීය සභාව - අදියර 1 සඳහා වස්කඩුව නගරයේ රථගාල, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සභා සභා ගර්භය සහ ශ්‍රවනාගාරය ඇතුළුව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 2 1/6 | 68.32 | ශ්‍රවනාගාරය භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | ගොඩනැගිල්ලේ කටයුතු සිදුකෙරේ. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ෆ) | බේරුවල ප්‍රාදේශීය සභාව-අදියර 1සඳහා අලුත්ගම ආයුර්වේද මධ්‍යස්ථානය, ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, උප කාර්යාලය, ප්‍රාදේශීය සභා සභා ගර්භය සහ මහජන පුස්තකාලය ඇතුලුව කාර්යාල සංකීර්ණය ඉදිකිරීම | 1/2 | 70.24 | පුස්තකාලය භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | ආයුර්වේද මධ්‍යස්ථානය සහ පුස්තකාලය පැරණි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලැබේ. පුස්තකාලය සඳහා වෙන්කරන ලද ඉඩ නව ගොඩනැගිල්ලේ ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා භාවිත කරන අතර පැරණි ගොඩනැගිල්ලේ මුළු ඉඩ භාවිතයෙන් පුස්තකාලය පවත්වාගෙන යනු ලැබේ. | -එම- |
| (අඅ) | පුත්තලම ප්‍රාදේශීය සභාව සඳහා මදුරංකුලියේ බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 1/6 | 61.69 | වෙළඳසැල් භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | නිරීක්ෂණය සමග එකග වේ. වෙළඳසැල් දෙකක් නිශ්කාර්යව පවති. | -එම- |
| (අආ) | උඩුනුවර ප්‍රාදේශීය සභාව සඳහා ගෙලිඔය රථගාල සහ පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 1 5/6 | 60.85 | වෙළඳසැල් භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | මේ වනවිට වෙළඳසැල් හයක ටෙන්ඩර් කටයුතු සිදු කරමින් පවති. | -එම- |
| (අඇ) | කැළණිය ප්‍රාදේශීය සභාව සඳහා නාහේන මාතෘ සායනය මධ්‍යස්ථානය, පූර්ණ ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය, තරුණසේවා සභාව, පුස්තකාලය සහ බහුකාර්යය ශාලාව ඇතුලුව බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම | 1/3 | 67.40 | මාතෘ සායනය මධ්‍යස්ථානය සහ තරුණසේවා සභාව භාවිතයට නිසි සැලැස්මක් නොමැත. | නිරීක්ෂණය සමග එකග වන අතර මාතෘ සායනය මධ්‍යස්ථානය සහ තරුණසේවා සභාව ක්‍රියාත්මක නොවේ. | -එම- |

### 3.3 මතභේදයට තුඩුදෙන ගැටලු

| විගණන ගැටලු | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **(i) ව්‍යාපෘති කළමණාකරන උපදේශකවරු** | | |
| ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක සඳහා වෙන් කරන ලද කාලය මිනිස් මාස 285.65කින් හෙවත් සියයට 59කින් වැඩිකර තිබුණි. ඒ අනුව උපදේශන ගිවිසුමේ සඳහන් උපදේශක ගාස්තුව 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 41.5කින් ඉක්මවා තිබුණි. | සියළුම විචලතා සඳහා අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය සහිතව ව්‍යාපෘති අධ්‍යක්ෂක එකතුකිරීම් අත්සන් කර තිබේ. | ව්‍යාපෘතිය එහි කටයුතු කඩිනම් කළ යුතු අතර අනවශ්‍ය වියදම් වළක්වා ගත යුතුය. |
| **(ii) අභ්‍යන්තර විගනණ උපදේශක** | | |
| තාක්ෂණික විගණන සිදුකිරීමට වර්ෂයක කාලයක් සඳහා තනි පුද්ගල උපදේශක වරයෙකු ලෙස ඉංජිනේරුවරයෙකු තෝරාගෙන තිබුණි. අමාත්‍යංශ ලේකම් සහ තාක්ෂණික විගණන උපදේශක විසින් අත්සන් කරන ලද ගිවිසුම අනුව, තාක්ෂණික විගණන උපදේශක ප්‍රධාන ගැටළු සහ නිර්දේශයන් අවසන් වාර්තාවේ වාර්තා කළ යුතුය. කෙසේවෙතත්, ඉහත වාර්තාවේ කිසිදු ප්‍රධාන ගැටළුවක් සහ නිර්දේශ අඩංගු වී නොතිබුණු අතර ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික විගණන උපදේශක වෙත රු. මිලියන 12.47ක් ගෙවා තිබුණි. | තාක්ෂණික විගණන උපදේශක කොන්ත්‍රාත් ප්‍රසම්පාදනය සිදු කිරීමට ව්‍යාපෘති කළමණාකරන ඒකකයට සහාය වී ඇත. | ව්‍යාපෘතිය ගෙවීම අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| **(iii) වත්කම් කළමනාකරණ මෘදුකාංගය** | | |
| ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ අවශ්‍ය ප්‍රසම්පාදන භාවිතයෙන් තොරව වත්කම් කළමනානරණය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස 2018 දෙසැම්බර් 15 දින අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ පළාත් හතෙහි ප්‍රාදේශීය සභා හතක් සඳහා උප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේවෙතත්, ඉහත මෘදුකාංගයෙහි සහය සහ නඩත්තු පද්ධතියක් සඳහා ඉහත ගිවිසුමේ ප්‍රතිපාදන නොතිබුණි. තවද, ඉහත ගිවිසුමේ වැඩ සැලැස්ම අනුව ශ්‍රී ලංකාවේ පළාත් පාලන අංශයේ පවතින රීති සහ භාවිතයන් අධ්‍යනයකින් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ උපදෙස් මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අමාත්‍යංශය වෙනත් සමාන ආයතන වෙත අවස්ථාව ලබාදීමට මෙම ප්‍රසම්පාදනය සඳහා CQS ක්‍රමය අනුගමනය කර ඇත. එමනිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නොමැත. | අවශ්‍ය ගුණාත්මක බව සහතික වෙමින් කටයුතු කඩිනමින් නිමකිරීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරු පෙලඹවීමට අවශ්‍ය වේ. |